**පාඩම: 11. මුල් ළමාවියෙහි පසුවන දරුවෙකු සඳහා ගවුම් පන්නයක් නිර්මාණය කිරීම.**

ක්‍රියාකාරකම - යෝග්‍ය පරිදි රෙදි වර්ග තෝරාගෙන ළමා ඇඳුම කපයි.

පියවර 01 - ළමා ඇඳුම සඳහා රෙදි තෝරා ගැනීම.

ළමා ගවුම සඳහා රෙදි මිලදී ගැනීමට වෙළෙඳපොලට ගියවිට විවිධ වර්ගයේ රෙදිවර්ග දක්නට ලැබුණි. ඒ අනුව ළමා ගවුම සඳහා රෙදි තේරීමේදී සැලකිය යුතු කරුණු පිළිබඳව පෙළපොත අධ්‍යයනය කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| ළමා ගවුම සඳහා රෙදි තෝරාගැනීමේ දී සළකා බැලිය යුතු කරුණු | ළමා ගවුමක තිබිය යුතු ලක්ෂණ |
|---|---|
| | |
| | |
| | |


පියවර 2 - ළමා ගවුම කැපීම

ඇඳුම කැපීමට පෙර ඒ සඳහා ගන්නා ලද රෙද්ද සූදානම් කරගත යුතුය. අප එය රෙදි පිරියම් කිරීම ලෙස හඳුන්වමු. රෙදි පිරියම් කිරීමේ ක්‍රම කිහිපයකි.

- රෙද්දේ ඇද හැරීම
- හැකිලීම වැළැක්වීම සඳහා රෙද්ද සෝදා වියළා ස්ත්‍රික්ක කර ගැනීම වැනි ක්‍රම අනුගමනය කල යුතුය.

  මූලික පතරොම භාවිත කර සකස් කර ගන්නා ලද පතරොම පිරියම් කරගත් රෙද්ද මත තබා පහත පියවර අනුගමනය කරමින් ඇඳුම කපාගන්න

I. රෙද්දේ දිගත් රේඛා ඔස්සේ හොඳපිට ඇතුලට සිටින සේ අවශ්‍ය පරිදි අවශ්‍ය රෙදි ප්‍රමාණය නවා ගන්න.
II. ඉදිරිපස කඳ කොටසෙහි පතරොම රෙද්දෙහි නවා ගත් කොටසෙහි මැද නැම්මට තබා අල්පෙනති ගසා කපා ගන්න.
III. පිටුපස කඳ කොටස හා අතෙහි පතරොම නිවැරදිව තබා ඇල්පෙනති ගසා කපාගන්න.
IV. සන්නාලි කාබන් කඩදාසිය හා දැති රෝදය භාවිතයෙන් දත්තු රේඛා සලකුනු කරන්න.




V. එක් එක් කොටසෙහි ඇල්පෙනෙති ගලවා පතරොම ඉවත් කරමින් රෙදි දෙපට පමණක් හසුවන ලෙස නැවත ඇල්පෙනෙති ගසාගන්න.

VI. රෙද්දෙහි කපාගත් කොටසෙහි සටහන් වී ඇති දත්තු රේඛා අනෙක් පසට ලකුණු කරන්න.'

VII. සාය කොටස සඳහා මීටර් 1 යි සෙන්ටිමීටර් 32 ක් පළල හා සෙන්ටිමීටර් 35 ක් උස රෙදි ප්‍රමාණයක් කපා ගන්න.